# පාසැල් ළමුන්ගේ ප්‍රතිශක්තිකරණය(එන්නත්) පිළිබඳ තොරතුරු

ඔබගේ දරුවාගේ පාසැල් කාලය පුරාම[1] ප්‍රතිශක්තිකරණ සටහන් වාර්තා නිසියාකාරලෙස පවත්වාගෙන යෑමට පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) නීතිමය වශයෙන් බැඳීසිටී.

## ඔබගේ දරුවා පාසැලකට ඇතුලත් කරනවිට

- ඔබගේ දරුවාගේ ප්‍රතිශක්තිකරණ සටහන් වාර්තා– VACCINATION RECORDS-දරුවා පාසැලට ඇතුලත්කරන අවස්ථාවේදී භාරදෙන්න, එවිට පාසැල, ප්‍රතිශක්තිකරණ සටහන් වාර්තාව, පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) වෙතට ලැබෙන්ට සලස්වයි.
- ඔබ දරුවා උපන්දා පටන් ලබාගෙන ඇති එන්නත්(මාත්‍රා) වාර්තා වී ඇත්දැයි පරීක්ෂාකර බලන්න.
- ඔබගේ දරුවාට අවශ්‍ය එන්නත් ලබාදීනැත්නම් හෝ එසේ දී ඇති බවට ඔප්පුකිරීමට අපහසුනම් පවුලේ වෛද්‍යවරයා හෝ පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) අමතන්න.
- පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) ළමුන්ගේ ප්‍රතිශක්තිකරණ සටහන් වාර්තා නිරතුරුවම පරීක්ෂා කරන අතර ඒවා ලමුන්ට පාසැල් යෑම සඳහා නිසියාකාරව පවත්වාගෙන යනුලබනු ඇත්දැයි සෝදිසි කරයි.
- අසම්පූර්ණ ප්‍රතිශක්තිකරණ සටහන්(වාර්තා) ඇති ළමුන්ට පාසැල් යෑමට අවසරය(අසම්පූර්ණ වීමට පිළිගතහැකි හේතු නොමැතිනම්) නොලැබිමට ඉඩ ඇත.
- කැනඩාවෙන් හෝ ඔන්ටාරියෝවෙන් පිටතදී ප්‍රතිශක්තිකරණයන්(එන්නත්) ළද දරුවකුඔන්ටාරියෝ ප්‍රතිශක්තිකරණ වැඩ පිළිවෙළට අනුව අවශ්‍ය අමතර එන්නත් සම්පූර්ණ කිරීමට නීතිමය වශයෙන් බැඳීසිටී.

## නිසිකලට ප්‍රතිශක්තිකරණය ලබා ගන්න.

- අවුරුදු හතරත් හයත් අතර ඔබගේ දරුවාට ඩිප්තීරියාව (ගලපටලය),කක්කල්කැස්ස, පිටගැස්ම සහ පෝලියෝ[2] (බාලක පක්ෂගාත රෝගය)සඳහා මාත්‍රාවන් ලබාදිය යුතුවේ.
- අවුරුදු දහහතරත් දහසයත් අතර ඔබගේ දරුවාට ඩිප්තීරියාව (ගලපටලය), කක්කල්කැස්ස, සහ පිටගැස්ම[2] සඳහා මාත්‍රාවන් ලබාදිය යුතුවේ.
- ප්‍රතිශක්තිකරණය ක්‍රියාත්මකවීමට නම් එය නිසිකලට ලබාදිය යුතුවේ. උදාහරණයක් වශයෙන්, MMR(සරම්ප, කම්මුල්ගාය, රුබෙල්ලා (ජර්මන් සරම්ප)) වල පලවන මාත්‍රාව[2] දරුවාගේ පලවන උපන්දිනයෙන් පසුවත්, දෙවන මාත්‍රාව අඩුම වශයෙන් පලවන මාත්‍රාවෙන් දින 28කට පසුවත් දීයයුතුවේ.

1. පාසැල් ලමුන්ගේ ප්‍රතිශක්තිකරණය නීතිය සැප්.1990. ක්වීන්ප්‍රින්ටර්ස්,ඔන්ටාරියෝ
2. කැනඩාවේ ප්‍රතිශක්තිකරණය උපදෙස්, 7වනප්‍රකාශනය කැනඩාවේ පබ්ලික් හෙල්ත් ඒජන්සියේ ප්‍රකාශයක්. 93/95 196/200

- ඔන්ටාරියෝ පාසැල්වලට ඇතුලත්වීම සඳහා අවශ්‍ය ප්‍රතිශක්තිකරණය නොමිලයේ ඔබ වෛද්‍යවරයාගෙන් ලබා ගත හැක.
- පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) ඔබගේ දරුවාගේ ප්‍රතිශක්තිකරණ සටහන්(වාර්තා) නොමිලයේ පරිවර්තනය කරදෙනු ඇත.
- පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH), මධ්‍යස්ථාන තුනකදි පාසැල් යන වයසේ හෙල්ත් කාඩ්පතක් නැති දරුවකු(පාසැලකට ඇතුලත්වීම සඳහා ප්‍රතිශක්තිකරණ සටහන්(වාර්තා)පතක් අවශ්‍ය අවස්ථාවකදී) නොමිලයේ අවශ්‍ය එන්නත් ලබා ගත හැක.
- පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH), පාසැලේදී එන්නත් දෙකක් ලබා දෙයි. හෙපටයිටිස්–බී සහ මෙනින්ගෝකෝකල්–සී (7වන පංතියේ)දිද හියුමන්පැපිලෝමා වයිරස (8වන පංතියේ)දිද දෙනුලැබේ.

## ඔබගේ දරුවාගේ ප්‍රතිශක්තිකරණ සටහන්(වාර්තා) නිසිපරිදි පවත්වාගෙන යන්න.

- ඔබගේ පවුලේ වෛද්‍යවරයා හෝ ඔබගේ දරුවාගේ පාසැල, දරුවාගේ ප්‍රතිශක්තිකරණ සටහන් පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) වෙතට ලබාදෙන්නේ නැත.
- ඔබගේ දරුවා පාසැලක ලියාපදිංචිවූ පසු **එන්නත් ලබාගන්නා සෑම වාරයකදීම ඔබ එය පීල් පබ්ලික් හෙල්ත් වෙතට දැනුම්දිය යුතුය.**

- පීල් පබ්ලික් හෙල්ත් (PEEL PUBLIC HEALTH) **905-799-7700 අමතන්න.** ඔබ කැලිඩන් (CALEDON) වලින් **අමතන්නේ නම් 905-584-2216. පරිවර්තන පහසුකම් තිබේ.**

- **වෙබ් අඩවියට යන්න. www.immunizepeel.ca** ඔබගේ දරුවාගේ ප්‍රතිශක්තිකරණයන්(එන්නත්) වෙබ් අඩවිය හරහා වාර්තා කළහැක.
- **තැපැල් හෝ අතින් භාරදියහැකි(පිටපතක් පමණක්) ලිපිනය-**

  7120 Hurontario Street, P.O. Box 630

  Mississauga, ON L5M 2C5

  (ලිපියක් තැපැල් කරනවා නම් මුල් පිටපත තැපැල් නොකරන්න)

Region of Peel
Working for you
Public Health